සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

09 S I, II

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கை பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2568 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024 (2025)

## (09) සෞඛ්‍ය විද්‍යාව - I, II

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සෞඛ්‍ය විද්‍යාව - I පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට පිළිතුරු ලිවීමට ලබාදෙන පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න. තවද එහි පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) අර්ථ දැක්වීමට අනුව පූර්ණ සෞඛ්‍යය යනු පුද්ගලයකුගේ කායික, මානසික, සමාජීය හා ආධ්‍යාත්මික යහපැවැත්මේ පූර්ණත්වයයි. ඒ අනුව ලෙඩ රෝගවලින් තොරවීම යනු,
   (1) කායික හා මානසික යහපැවැත්මේ ලක්ෂණයකි.
   (2) මානසික හා සමාජීය යහපැවැත්මේ ලක්ෂණයකි.
   (3) සමාජීය හා ආධ්‍යාත්මික යහපැවැත්මේ ලක්ෂණයකි.
   (4) කායික හා ආධ්‍යාත්මික යහපැවැත්මේ ලක්ෂණයකි.

2. පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ පහත සඳහන් කාර්ය, පිරිවෙනෙහි ක්‍රියාත්මක කරමින් සිටියි.
   * ඇදුරු මඬුල්ලේ සහාය ඇතිව ශිෂ්‍ය භික්ෂූන්ගේ නිපුණතා සංවර්ධනය කිරීම සහ හිතකර ප්‍රතිපත්ති සැකසීම
   * දායකයන්ගේ සහ භික්ෂූන්ගේ සහාය ඇතිව පිරිවෙන් පරිසරය අලංකාර කිරීම
   * ශිෂ්‍ය භික්ෂූන්ගේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීම සඳහා අවශ්‍ය සේවා ලබා ගැනීම

   පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ මේ උත්සාහ ගන්නේ,
   (1) ශිෂ්‍ය භික්ෂූන්ගේ සෞඛ්‍යය විෂයය පිළිබඳ දැනුම සංවර්ධනය කිරීමට ය.
   (2) හිතකර පිරිවෙන් පරිසරයක් ඇති කිරීමට ය.
   (3) පිරිවෙන, සෞඛ්‍ය ප්‍රවර්ධන පිරිවෙනක් බවට පත් කිරීමට ය.
   (4) ශිෂ්‍ය භික්ෂූන්ගේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීමට ය.

3. ප්‍රසන්න පෙනුමකින් යුත්, උගත්, සංඝ භික්ෂූන් වහන්සේ බෞද්ධාගමික මෙන් ම අන්‍ය ආගමික උත්සව සඳහා ද පූර්ණ සහයෝගය දක්වමින් ක්‍රියාකරන කාර්යක්ෂම, ජනප්‍රිය හිමි නමකි. මෙම තොරතුරු අනුව නිගමනය කළ හැක්කේ උන්වහන්සේ,
   (1) ආගම, දහමට ලැදි බව ය.
   (2) නිරෝගී බව ය.
   (3) කා අතරත් ජනප්‍රිය බව ය.
   (4) පූර්ණ සෞඛ්‍යයකින් යුතු බව ය.

4. පිරිවෙන්වල අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සැමදා උදේ, සවස බුද්ධ වන්දනාව සිදුකරමින්, දායකයන් සමග එක්ව සුහදශීලීව ආගමික වතාවත්වල යෙදෙති. මෙම විස්තරය අනුව පැහැදිලි වන්නේ, එම භික්ෂූන් වහන්සේලා,
   (1) ආධ්‍යාත්මික යහපැවැත්මකින් යුතු බව ය.
   (2) මානසික යහපැවැත්මකින් යුතු බව ය.
   (3) සමාජීය යහපැවැත්මකින් යුතු බව ය.
   (4) කායික යහපැවැත්මකින් යුතු බව ය.

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

● පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් වූ දා *A*, *B*, *C* සහ *D* යන ශිෂ්‍යයන් සිව්දෙනකු තුළ ඇති වූ චිත්තවේග පහත දැක්වේ. ඒ ඇසුරෙන් ප්‍රශ්න අංක **5** සහ **6** ට පිළිතුරු සපයන්න.

*A* - තමා බලාපොරොත්තු වූ ප්‍රතිඵල නොලද බැවින් දුකට පත් විය.

*B* - විෂයයන් සියල්ලටම ඉහළ සාමාර්ථ ලබා ඇති බැවින් සතුටට පත් විය.

*C* - සියලු විෂයයන්ගෙන් අසමත් වී ඇති බැවින් තරහ ඇති විය.

*D* - සියලු විෂයයන් සඳහා සාර්ථක ප්‍රතිඵල නොලද බැවින් ගුරුවරුන්ගෙන් දොස් ඇසීමට සිදුවේ යැයි බියට පත් විය.

5. මෙම ශිෂ්‍යයන්ගෙන් ප්‍රසන්න චිත්තවේග ඇති වී ඇත්තේ,
(1) *A* ට ය. (2) *B* ට ය. (3) *C* ට ය. (4) *D* ට ය.


6. ඔවුනට ඇති වී ඇති චිත්තවේගවලින් අහිතකර චිත්තවේගය/චිත්තවේග වන්නේ,
(1) තරහ පමණි. (2) දුක සහ බිය පමණි.
(3) බිය සහ තරහ පමණි. (4) දුක, තරහ සහ බිය පමණි.

7. ශරීර ස්කන්ධ දර්ශක (BMI) සටහනට අනුව නිසි කායික යහපැවැත්ම සඳහා ඔබගේ BMI අගය සැමවිටම පවත්වා ගැනීමට උත්සාහ කළ යුත්තේ,
(1) කොළ පැහැති පරාසයේ ය. (2) තැඹිලි පැහැති පරාසයේ ය.
(3) ලා දම් පැහැති පරාසයේ ය. (4) තද දම් පැහැති පරාසයේ ය.

8. පුද්ගලයකු පුරුද්දක් ලෙස තෙල්, සීනි හා ලුණු අධික ආහාර පරිභෝජනය කරයි. නිතිපතා ව්‍යායාම්වල නිරත නොවෙයි. මෙම තොරතුරු අනුව BMI අගය දක්වන සටහනේ ඔහු/ඇය අයත් විය හැක්කේ,
(1) තද දම් පාට හෝ ලා දම් පාට කලාපයට ය. (2) ලා දම් පාට හෝ තැඹිලි පාට කලාපයට ය.
(3) කොළ පාට කලාපයට ය. (4) තද දම් පාට කලාපයට ය.

9. "සත්ත්වයින් හා වෘක්ෂලතා ආදිය ලොව පහළ වී ඇත්තේ වසර කෝටි ගණනක් තිස්සේ සිදු වූ පරිණාමය නිසා ය" යන මතය ඉදිරිපත් කරන ලද්දේ,
(1) බුදුරජාණන් වහන්සේ විසිනි. (2) ඇරිස්ටෝටල් විසිනි.
(3) චාල්ස් ඩාවින් විසිනි. (4) සොක්‍රටීස් විසිනි.

10.




මෙම සටහනේ හිස්තැන පිරවීමට වඩාත් සුදුසු වචන අඩංගු වරණය තෝරන්න.
(1) ශිෂ්‍ය භික්ෂූන්ගේ දින චර්යා (2) සෞඛ්‍ය අධ්‍යාපනයේ මාතෘකා
(3) සෞඛ්‍යවත් පිරිවෙන් ප්‍රතිපත්ති කිහිපයක් (4) සෞඛ්‍ය සේවාව ලබාදෙන අවස්ථා

11. පිරිවෙන තුළ වැඩ වසන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සුරක්ෂිතතාව නැතිවීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵලය කුමක් ද?
(1) ගුරු හාමුදුරුවන් සමග ඇති සබඳතා අඩු වීම
(2) අයහපත් අන්තර් පුද්ගල සබඳතා අඩු වීම
(3) පිරිවෙන් පරිසරය පිරිසිදුව තබාගත හැකි වීම
(4) රසවින්දනයට අවස්ථාව ලැබීම

[ 3 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

● නව යොවුන් වියෙහි පසුවන සුබෝධ හිමිගේ දක්නට ලැබෙන වෙනස්කම් කිහිපයක් පහත දැක්වේ. ඒ ඇසුරින් ප්‍රශ්න අංක **12** සහ **13** ට පිළිතුරු සපයන්න.

*A* - ස්වාධීනව කටයුතු කිරීමට කැමති ය.
*B* - චිත්තවේගවලට ඉක්මන් ප්‍රතිචාර දක්වයි.
*C* - සැමවිටම බුද්ධිමත් තීරණ ගනියි.
*D* - මාංශ පේශි වර්ධනය වී ඇත.

12. සුබෝධ හිමිගේ දක්නට ලැබෙන මානසික වෙනස්කම් දක්වා ඇති ඉංග්‍රීසි අක්ෂර වන්නේ,
(1) *A*, *B* සහ *C* ය. (2) *A*, *B* සහ *D* ය. (3) *A*, *C* සහ *D* ය. (4) *B*, *C* සහ *D* ය.

13. *D* අක්ෂරයෙන් දක්වා ඇත්තේ සුබෝධ හිමිගේ,
(1) කායික වෙනස්කමකි. (2) මානසික වෙනස්කමකි.
(3) සමාජීය වෙනස්කමකි. (4) අධ්‍යාත්මික වෙනස්කමකි.

14. ජීවිතයේ යහපැවැත්ම සඳහා අනුගමනය නොකළ යුතු චර්යාවක් වන්නේ,
(1) සිරුරේ බර පාලනය කර ගැනීම යි. (2) ක්ෂණික ආහාරවලට හුරුවීම යි.
(3) දුම්වැටි, මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම යි. (4) සම්මත නීති රීති පිළිපැදීම යි.

● අංක **15** සහ **16** ප්‍රශ්නවල හිස්තැන් පිරවීමට සුදුසු වචනය/වචන අඩංගු වරණය තෝරන්න.

15. අස්ථි සහ සන්ධි සම්බන්ධ අනතුරුවලදී, සන්ධිය හා සම්බන්ධ අස්ථි වෙන්වීම ..................... යනුවෙන් හැඳින්වේ.
(1) උලුක්කු වීම (2) භග්න වීම (3) විසන්ධි වීම (4) පිපිරීම

16. අතෙහි වැලමිට සන්ධිය අනතුරකට භාජනය වූ අවස්ථාවකදී ප්‍රථමාධාරයක් ලෙස උරමාවක් යෙදීම සඳහා ..................... භාවිත කළ හැකි ය.
(1) පතුරු (Splint) (2) ආරක්ෂක (Padding)
(3) ක්‍රේප් වෙලුම් පටි (Crepe bandage) (4) ත්‍රිකෝණ වෙලුම් පටි (Triangular bandage)

17. බුදු දහමට අනුව 'ආරෝග්‍ය' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) කායික, මානසික නිරෝගීභාවය (2) සතුට සොම්නස ඇතිවීම
(3) ජීවිතය ගැන අවබෝධය (4) කායික රෝගවලින් තොරවීම

18. භූතගාමයට අනුව මුල්වලින් හා කඳෙන් වෘක්ෂ හටගන්නා ක්‍රමය හඳුන්වන්නේ,
(1) ඛන්ධකබීජං යනුවෙනි. (2) බීජබීජං යනුවෙනි.
(3) ඵළුබීජං යනුවෙනි. (4) මූලබීජං යනුවෙනි.

19. ශ්‍රී මහා බෝ සමිඳුන්ගේ බෝපත් සුළඟට ලෙලදීම, නෙළුම් මල්වල සුවඳ විහිදීම සහ බෝ මළුව දෙසින් ඇසෙන සන්ධ්‍යා නාදය යන උත්තේජ හඳුනාගන්නා සංවේදන පිළිවෙළින් සඳහන් වන පිළිතුර කුමක් ද?
(1) පෙනීම, සුවඳ දැනීම, ඇසීම (2) පෙනීම, ඇසීම, සුවඳ දැනීම
(3) සුවඳ දැනීම, පෙනීම, ඇසීම (4) ඇසීම, සුවඳ දැනීම, පෙනීම

20. ශරීරයේ ඇති බහිස්ස්‍රාවීය ඉන්ද්‍රියයන් වන්නේ,
(1) වෘක්ක, ගුදය සහ පෙනහලු ය. (2) වෘක්ක, ගුදය සහ සම ය.
(3) සම, පෙනහලු සහ වෘක්ක ය. (4) ගුදය, පෙනහලු සහ සම ය.

21. උපාලි භික්ෂුවගේ තයිරොයිඩ් ග්‍රන්ථිය ක්‍රමයෙන් විශාලවන බව වෛද්‍ය මතය විය. මෙම තත්ත්වයට හේතුව විය හැක්කේ,
(1) ඇඩ්‍රිනලීන් හෝර්මෝනය නිපදවීම අඩුවීම ය.
(2) තයිරොක්සීන් හෝර්මෝනය නිපදවීම අඩුවීම ය.
(3) ඔක්සිටොක්සීන් හෝර්මෝනය නිපදවීම අඩුවීම ය.
(4) ටෙස්ටස්ටෙරෝන් හෝර්මෝනය නිපදවීම අඩුවීම ය.

[ 4 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

22. පිහිනීමට නොහැකි ප්‍රථමාධාරකරුවකු, දියේ ගිලෙන්නකු බේරා ගැනීමට යාමේදී පහත සඳහන් කරුණු අතුරින් නොකළ යුතු කරුණ කුමක් ද?
    (1) පළමුව තමාගේ ආරක්ෂාව ගැන සිතීම
    (2) දියේ ගිලුණු පුද්ගලයාගේ පිටුපසින් දියට බැසීම
    (3) දිග ලීයක් හෝ කඹයක් හෝ දියේ ගිලෙන්නා දෙසට විසි කිරීම
    (4) රෝගියාගේ උඩුකය, හෘදයට වඩා පහතට නැඹුරු කොට දියෙන් ගොඩ ගැනීම

23. අවශ්‍ය අවස්ථාවකදී භික්ෂූන් වහන්සේලාගේ පරිභෝජනය සඳහා 2025.10.28, 2025.12.01, 2025.12.31, 2026.01.03 යන කල් ඉකුත්වීමේ දින සඳහන් පොල්කිරි පැකට් හතරක් පිරිවෙනට ලැබී ඇත. පරිහරණ පහසුව සඳහා මෙම පොල්කිරි පැකට්, රාක්කයේ තැන්පත් කිරීම ඔබට පැවරී ඇත්නම්, රාක්කයේ ඉදිරියෙන් ම තබන පැකැට්ටුවේ කල් ඉකුත්වීමේ දිනය කුමක් ද?
    (1) 2025.10.28 (2) 2025.12.01 (3) 2025.12.31 (4) 2026.01.03

24. ආහාර නරක් වීමේ ප්‍රතිඵලයක් නොවන්නේ,
    (1) ආහාරයේ වර්ණය වෙනස් වීම ය. (2) ආහාරයේ රසය වෙනස් වීම ය.
    (3) දුගඳක් ඇති වීම ය. (4) පෝෂණ ගුණය වැඩි වීම ය.

25. භික්ෂූන්ගේ පරිභෝජනය සඳහා ආහාර සකස් කිරීමේදී එහි ගුණාත්මකභාවය පිරිහීමට හේතුවක් විය හැක්කේ,
    (1) සුදුසු ආහාර වර්ග කිහිපයක් එක්ව පිසගැනීම ය.
    (2) කහ, උළුහාල්, කුරුඳු වැනි කුළුබඩු ආහාරයට යෙදීම ය.
    (3) පිසීමේදී බොහෝ වේලාවක් ආහාර තැම්බීම ය.
    (4) අයඩීන් සහිත ලුණු ආහාරයට එක් කිරීම ය.

26. රුධිර පාරවිලයනයේදී විශේෂයෙන්ම සැළකිය යුතු කරුණ කුමක් ද?
    (1) දායක සහ ප්‍රතිග්‍රාහක රුධිර ගණ ගැළපීම
    (2) ප්‍රතිග්‍රාහකයා වයස අවුරුදු 21 ට වඩා වැඩි වීම
    (3) දායකයා ස්ථූලතාවෙන් යුතු නොවීම
    (4) ප්‍රතිග්‍රාහකයාට රෝග වැළඳී නොතිබීම

27. ප්‍රතිශක්තිකරණ ක්‍රියාවලිය මගින් බෝවීම වැළැක්විය හැකි රෝග කාණ්ඩය කුමක් ද?
    (1) තැලසීමියාව, ක්ෂය රෝගය, කම්මුල්ගාය, වකුගඩු රෝග
    (2) ක්ෂය රෝගය, සරම්ප, රුබෙල්ලා, කම්මුල්ගාය
    (3) හිමොෆීලියාව, පෝලියෝ, කක්කල් කැස්ස, ගලපටලය
    (4) දියවැඩියාව, අධිරුධිර පීඩනය, පිටගැස්ම, ජපනීස් එන්සෙෆලයිටිස්

28. පාරිශුද්ධිය යටතේ බුදුදහමෙහි සඳහන් අභ්‍යන්තර පිරිසිදු බව ලෙස දැක්වෙන්නේ,
    (1) චීවර පිරිසිදුව තබා ගැනීම ය. (2) මනස පිරිසිදුව තබා ගැනීම ය.
    (3) සෙනසුන පිරිසිදුව තබා ගැනීම ය. (4) කය පිරිසිදුව තබා ගැනීම ය.

29. භික්ෂූන්ගේ ප්‍රධාන ඇඳුම් කට්ටලය වන්නේ,
    (1) අඳනය, තනිපට සිවුර හා විජිනි පත වේ. (2) අඳනය, දෙපට සිවුර හා විජිනි පත වේ.
    (3) තනිපට සිවුර, දෙපට සිවුර හා විජිනි පත වේ. (4) අඳනය, තනිපට සිවුර හා දෙපට සිවුර වේ.

30. සුව පහසු දිවියක් සඳහා ව්‍යායාමවල අවශ්‍යතාව, බුදුහිමි පෙන්වා දුන්නේ,
    (1) ආහාරසප්පාය මගිනි. (2) උතුසප්පාය මගිනි.
    (3) විහරණසප්පාය මගිනි. (4) පුග්ගලසප්පාය මගිනි.

31. ගිලන් වූ භික්ෂුවකට ප්‍රතිකාර කිරීම සඳහා කහට බෙහෙත් අවශ්‍ය බැවින්, එම බෙහෙත් සොයා ගෙන එන ලෙස වෛද්‍යවරයා ඔබට පවසයි. තථාගතයාණන් වහන්සේ දේශනා කළ ඖෂධ අනුව ඔබ සොයා ගෙන එන්නේ,
    (1) කහ සහ ඉඟුරු ය. (2) කරඳ සහ වද කහ ය.
    (3) කොහොඹ සහ සාදික්කා ය. (4) කරඳ සහ කොහොඹ ය.

32. අෂ්ටාංග ආයුර්වේදයට අනුව සර්වාංගයෙහි ඇතිවන සියලු රෝග ඔසු යොදා සුව කිරීම හඳුන්වන්නේ,
    (1) ශාලාක්‍ය චිකිත්සාව යනුවෙනි. (2) කාය චිකිත්සාව යනුවෙනි.
    (3) වාජීකරණ චිකිත්සාව යනුවෙනි. (4) රසායන චිකිත්සාව යනුවෙනි.

[ 5 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

33. අංග පූර්ණ ආහාරය පිළිබඳ සාවද්‍ය අර්ථ දැක්වීම ඇතුළත් වරණය කුමක් ද?
(1) රස හයක් නියමිත ප්‍රමාණයට අඩංගු ආහාරයකි
(2) සියලු පෝෂක සුදුසු ප්‍රමාණයට අඩංගු ආහාරයකි
(3) සමබල/තුලිත ආහාරයකි
(4) ශාක හා මාංශ කොටස් අඩංගු ආහාරයකි

34. මානසික රෝග සඳහා ලබාදෙන ආනුභවික ප්‍රතිකාර ක්‍රමයකි,
(1) බෝධි පූජා පැවැත්වීමෙන් හා පිරිත් කීමෙන් ප්‍රතිකාර කිරීම.
(2) සෙත් කවි කීමෙන් හා ශාන්ති කර්ම කිරීමෙන් ප්‍රතිකාර කිරීම.
(3) පරීක්ෂණ හා නිරීක්ෂණ ආදියෙන් ලබාගන්නා තොරතුරු අනුව ප්‍රතිකාර කිරීම.
(4) තෙල් මැතිරීමෙන් හා නූල් බැඳීමෙන් ප්‍රතිකාර කිරීම.

35. පවුලේ ඇතිවන ආරවුල් හා ආර්ථික දුෂ්කරතා හේතුවෙන් ශිෂ්‍යයකු විභාගය අසමත් වී, ඉච්ඡාභංගත්වයට පත් වී නිතර නොසන්සුන් ගතියක් පෙන්නුම් කර ඇත. වෛද්‍ය අනාවරණ අනුව ඔහු කිසියම් රෝග තත්ත්වයකට පත්ව ඇති බව පවසයි. එම රෝග තත්ත්වය,
(1) මානසික රෝගයක් විය හැකි ය. (2) කායික රෝගයක් විය හැකි ය.
(3) බෝවන රෝගයක් විය හැකි ය. (4) සමාජ රෝගයක් විය හැකි ය.

36. භික්ෂූන්ගේ පාසුවිහරණය සඳහා උපාසිකාවක් විසින් කිරි, දීකිරි, මෝරු, වෙඬරු සහ ගිතෙල් පූජා කරන ලදි. එම උපාසිකාව පූජා කොට ඇත්තේ,
(1) පස්ගෝරස ය. (2) පස්බෙහෙත් ය. (3) අෂ්ටපාන ය. (4) ක්ෂීරපානය ය.

37. ආයුර්වේදයට අනුව 'හිත ආයුෂ' යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) සැප ජීවිතය වේ. (2) යහපත් ජීවිතය වේ.
(3) අයහපත් ජීවිතය වේ. (4) දුක ජීවිතය වේ.

38. පහත සඳහන් ප්‍රකාශය හා හේතුව සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර තෝරන්න.
ප්‍රකාශය - සමාජ සත්කාරක වැඩසටහන්වලට සහ ආගමික වැඩසටහන්වලට සහභාගි වීමට, ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට අවස්ථාව ලබාදිය යුතු ය.
හේතුව - ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ ආත්මාභිමානය සංවර්ධනය කර ගැනීමට අවස්ථාව සැපයිය යුතු වේ.
(1) ප්‍රකාශය හා හේතුව සත්‍ය වේ.
(2) ප්‍රකාශය හා හේතුව අසත්‍ය වේ.
(3) ප්‍රකාශය සත්‍ය වන අතර හේතුව අසත්‍ය වේ.
(4) ප්‍රකාශය අසත්‍ය වන අතර හේතුව සත්‍ය වේ.

● පහත සඳහන් *A*, *B*, *C* සහ *D* හි සඳහන් වන සිද්ධි යුගල් අධ්‍යයනය කර ප්‍රශ්න අංක **39** හා **40** ට පිළිතුරු සපයන්න.

*A* – (i) ආහාර ප්‍රවාහනය, ගබඩා කිරීම හා පිළියෙල කිරීම ආදී අවස්ථාවල ආහාරයට ගල්, වැලි වැනි අපද්‍රව්‍ය එක් වීම
(ii) ආහාරයේ සුරක්ෂිතතාව හීන වීම

*B* – (i) කාමසුඛල්ලිකානුයෝගය හෝ අත්තකිලමථානුයෝගය අනුව ජීවත්වීමට හුරු වීම
(ii) ජීවිතයේ යහපැවැත්මට බාධා ඇති වීම

*C* – (i) පිරිවෙනෙහි වතුර එක්රැස්වන ස්ථාන ඉවත් කිරීම
(ii) ඩෙංගු රෝගය ව්‍යාප්තවීමේ අවධානම ඇති වීම

*D* – (i) කණ්ඩායමක් තුළ කණ්ඩායම් හැඟීමෙන් තොරව ක්‍රියා කිරීම
(ii) අභියෝග ජය ගැනීමේ හැකියාව ඇති වීම

39. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ වැඩි වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල් සහිත අක්ෂර වන්නේ,
(1) *A* සහ *B* ය. (2) *A* සහ *C* ය. (3) *B* සහ *D* ය. (4) *C* සහ *D* ය.

40. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ අඩු වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල් සහිත අක්ෂර වන්නේ,
(1) *A* සහ *B* ය. (2) *A* සහ *C* ය. (3) *B* සහ *D* ය. (4) *C* සහ *D* ය.

* *

[ 6 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

**09 | S | I, II**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2568 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024 (2025)

## (09) සෞඛ්‍ය විද්‍යාව - I, II

## සෞඛ්‍ය විද්‍යාව - II පත්‍රය

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය.
* පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

---

**1.** පහත දැක්වෙන සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

විවේකාරාම පිරිවෙනෙහි සෞඛ්‍ය ප්‍රවර්ධන සංගමය විසින් පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටින භික්ෂූන් වහන්සේලා සහ ගිහි සිසුන් ඉලක්ක කර ගනිමින් "පද්ධතිවල සෞඛ්‍යවත් බව රැක ගනිමු" මැයෙන් දේශන මාලාවක් විහාරාධිපති හිමිගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

පැමිණි සිටි පිරිස පංචශීලයෙහි පිහිටුවීමෙන් අනතුරුව නායක ස්වාමීන් වහන්සේ "ආරෝග්‍යා පරමාලාභා" ගාථාව ගෙන හැර දක්වමින් නිරෝගී දිවියෙහි වැදගත්කම පහදා දුනි.

අනතුරුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමන් විසින් ශරීරය ගොඩ නැගී ඇති පද්ධති ලෙස ශ්වසන, රුධිර සංසරණ ඇතුලුව පද්ධති පිළිබඳ හඳුන්වා දෙන ලදී.

ශ්වසන පද්ධතිය ගැන සාකච්ඡා කළ වෛද්‍යතුමන්, එහි කාර්යභාරය හා වාතය පෙනහලු තෙක් ගමන් ගන්නා මාර්ගය නාස් කුහරය, ග්‍රසනිකාව, ස්වරාලය, ස්වාසනාලය සහ ශ්වාසනාලිකා ලෙස පිළිවෙලින් හඳුන්වා දුනි. එමෙන්ම, ශ්වසන පද්ධතියට වැළැඳෙන බෝවන රෝග ලෙස සෙම්ප්‍රතිශ්‍යාව, ඉන්ෆ්ලුවන්සාව ඇතුලු රෝග රැසක් ද ඒවායෙන් වැලකීමට ගත යුතු ක්‍රියාමාර්ග ලෙස ව්‍යායාමවල නිරත වීම, පරිසරය පවිත්‍රව තබා ගැනීම ඇතුලු යහපුරුදු රැසක් ද පැහැදිලි කරන ලදී. අනෙකුත් පද්ධති පිළිබඳව ද වෛද්‍යතුමන් ඉහත අයුරින් ම පැහැදිලි කිරීමෙන් අනතුරුව දිවා ආහාරය සඳහා අවස්ථාව ලබා දුනි.

දිවා ආහාරය ලෙස බත්, මාළු, පරිප්පු, කොළ මැල්ලුමක් හා වම්බොටු බැදුමක් ද අතුරුපස ලෙස කෙසෙල් ගෙඩි ද සූදානම්ව තිබුණි.

අනතුරුව විහාරාධිපති හිමියන් පද්ධතිවල සෞඛ්‍ය රැක ගැනීම සඳහා වැදගත් බුදුන්වහන්සේ දේශනා කළ සප්පාය, පාරිශුද්ධිය හා ඖෂධ පිළිබඳ දැනුවත් කරන ලදී.

එහිදී සප්පාය පැහැදිලි කිරීමේදී උන් වහන්සේ විසින් ආහාර සප්පාය, විහරණ සප්පාය, උතු සප්පාය ඇතුලු කරුණු පහක් ගෙනහැර දක්වන ලදී.

පාරිශුද්ධිය පිළිබඳ සාකච්ඡා කිරීමේදී සක්මන් කිරීමෙහි ආනිසංස ලෙස, චංකමනානිසංස සූත්‍රයේ සඳහන් දුර ගමන් යා හැකි වීම (අද්ධානක්ඛමො හොති), වීර්යය කිරීමට සමත් වීම (පධානක්ඛමො හොති) ආදී ආනිසංස පහක් පැහැදිලි කරන ලදී.

විහාරාධිපති හිමියන් විසින් තථාගතයන් වහන්සේ දේශනා කළ ඖෂධ ලෙස පස් බෙහෙත් (පඤ්චභේසජ්ජ), වසා බෙහෙත් (වසාභේසජ්ජ) ආදි ඖෂධ රැසක් හඳුන්වා දෙන ලදී. අනතුරුව සියලු දෙනා කෙටි භාවනා වැඩසටහනක නිරත කර වූ අතර, පිං අනුමෝදන් කිරීමෙන් පසුව වැඩසටහන අවසන් කරන ලදී.

[ 7 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(i) 'ආරෝග්‍යා පරමාලාභා' ගාථාවෙහි ඇතුළත් සෞඛ්‍යවත් බව රැක ගැනීමේදී අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර දෙකක් සඳහන් කරන්න.

(ii) සිද්ධියෙහි සඳහන් නොවන වෛද්‍යතුමන් සඳහන් කළ වෙනත් පද්ධති දෙකක් නම් කරන්න.

(iii) වෛද්‍යතුමන් සඳහන් කළ ශ්වසන ගමන් මාර්ගයෙහි ඉතිරි කොටස් දෙක නම් කරන්න.

(iv) සිද්ධියෙහි සඳහන් නොවන, වෙනත් බෝවන ශ්වසන රෝග දෙකක් නම් කරන්න.

(v) ශ්වසන රෝග වලක්වා ගැනීමට ගත යුතු, සිද්ධියේ සඳහන් නොවන වෙනත් ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(vi) දිවා ආහාරයෙහි බහුලව අඩංගු මහා පෝෂක වර්ගයක් හා ක්ෂුද්‍ර පෝෂක වර්ගයක් වෙන වෙන ම නම් කරන්න.

(vii) සප්පාය පිළිබඳ විහාරාධිපති හිමියන් සඳහන් කළ සිද්ධියේ ඇතුළත් නොවන අනෙකුත් කොටස් දෙක ලියන්න.

(viii) විහාරාධිපති හිමියන් සඳහන් කළ සිද්ධියේ සඳහන් නොවන සක්මනෙහි වෙනත් ආනිසංස දෙකක් සඳහන් කරන්න.

(ix) තථාගතයන් වහන්සේ දේශනා කළ, සිද්ධියේ සඳහන් නොවන වෙනත් ඖෂධ වර්ග දෙකක් ලියන්න.

(x) භාවනා වැඩසටහන්වලට සහභාගිවීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

**2.** (i) ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක්, සෞඛ්‍ය විද්‍යාව විෂයය හැදෑරීමේ වැදගත්කම පෙන්වාදීමට කරුණු දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශිෂ්‍ය භික්ෂුවක්, ක්‍රියාකාරී දිවි පැවැත්ම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට යෝග්‍යවන ලෙස, සෞඛ්‍යවත් පිරිවෙන් පරිසරයක තිබිය යුතු අංග පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**3.** රුක් රෝපණයේ වැදගත්කම පෙන්වා දුන් බුදුරජාණන් වහන්සේ, බොහෝ ධර්ම දේශනා පවත්වන ලද්දේ සහ වස් විසුවේ වනාන්තර සහ උයන් ඇසුරෙනි.

(i) බෞද්ධ සාහිත්‍යයේ සඳහන් පරිදි විවිධ අවස්ථාවලදී භාවිත කළ එක් වනයකි කිඹුල්වත් මහ වනය. එවැනි වෙනත් වනාන්තර දෙකකට උදාහරණ දක්වන්න. (ලකුණු 02 යි)

(ii) බුද්ධ චරිතයෙහි තුරු ලතාවන් හා සම්බන්ධවන වැදගත් අවස්ථා තුනක් දක්වන්න. (ලකුණු 03 යි)

(iii) මිනිසාගේ පැවැත්මට ගස් වැල් ප්‍රයෝජනවත්වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**4.** බෝවන සහ බෝනොවන රෝගවලින් ආරක්ෂා වීම සඳහා පිරිවෙනෙහි වැඩවසන භික්ෂූන් වහන්සේලා, පෞද්ගලික සෞඛ්‍යය මෙන් ම පරිසර පවිත්‍රතාව ද රැකගත යුතු වේ.

(i) පිරිවෙනෙහි පරිසර පවිත්‍රතාව රැක ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලා අනුගමනය කළ යුතු යහපුරුදු දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) බෝනොවන රෝගයක් නම් කර, බෝනොවන රෝගවලින් වැළකීම සඳහා භික්ෂූන් වහන්සේලා අනුගමනය කළ යුතු යහපුරුදු දෙකක් ලියන්න. (ලකුණු 03 යි)

(iii) බෝවන රෝගවලින් ආරක්ෂාවීම සඳහා පෞද්ගලික පිරිසිදුකම රැක ගැනීමට අනුගමනය කළ යුතු යහ පුරුදු පහක් ලියන්න. (ලකුණු 05 යි)

[ 8 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**5.** දියරමය ප්ලාස්මයකින් හා එහි අවලම්භිත රුධිර සෛල වලින් රුධිරය සමන්විත වේ.

(i) රුධිර සෛල වර්ග **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) කෘත්‍රිම ලෙස ශරීරයට රුධිරය ලබාදීම රුධිර පාරවිලයනය යි. පුද්ගලයකුට රුධිර පාරවිලයනය අවශ්‍ය විය හැකි අවස්ථා **තුනක්** ලියන්න. *(ලකුණු 03 යි)*

(iii) රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත රෝගවලින් වැළකීම සඳහා ඔබ අනුගමනය කරන හොඳ පුරුදු **පහක්** සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*

**6.** (i) ආයුර්වේදයට අනුව 'දෝෂ කෝපය' නිසා වැළඳෙන ඇතැම් රෝග බෙදා දැක්විය හැකි කාණ්ඩ **දෙක** මොනවා ද? *(ලකුණු 02 යි)*

(ii) ආයුර්වේදයේ සඳහන් පරිදි 'හිත බව' හෙවත් 'යහපත් බව' කින් යුතු ආහාරයක් ඔබ තෝරාගන්නේ නම් එහි තිබිය යුතු ගුණාංග **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) චරක ආචාර්යවරයාට අනුව ආහාරයෙන් ලැබෙන ගුණ **පහක්** ලියන්න. *(ලකුණු 05 යි)*

**7.** (i) පහත සඳහන් වාක්‍ය ඛණ්ඩ ගලපා 'මානසික සෞඛ්‍යය' යන්න සඳහා අර්ථ දැක්වීමක් ගොඩ නගන්න.

- ඵලදායී පුද්ගලයකු ලෙස සමාජානුයෝගී වීම
- අභියෝග ජය ගෙන
- ජීවිතයේ සාමාන්‍ය ආතතිය සඳහා සාර්ථකව මුහුණ දෙමින්
- තමාගේ ශක්‍යතාවන් තේරුම් ගෙන *(ලකුණු 02 යි)*

(ii) මානසික රෝග ඇති වීමට බලපාන හේතු **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) මානසික සුවතාව ඇතිකර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග **පහක්** ලියන්න. *(ලකුණු 05 යි)*

**8.** (i) මිනිස් සිරුරට ජලය අවශ්‍යවන්නේ කුමක් සඳහා ද යන්න පෙන්වා දීමට කරුණු **දෙකක්** ඉදිරිපත් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ජලය දූෂණයවන ආකාර **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*


(iii) සීමිත සම්පතක්වන ජලය පරිහරණයේදී අනුගමනය කළ යුතු යහපුරුදු **පහක්** ලියන්න. *(ලකුණු 05 යි)*

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka


## B කොටස

**2.** (i) පහත රූපයේ දක්වා ඇත්තේ එක ම ලෝහයෙන් තනා ඇති විද්‍යුත් සන්නායක කම්බි තුනකි.
$A$ සහ $B$ වල හරස්කඩ වර්ගඵල සමාන නමුත් $B$ට වඩා $A$ දිගින් වැඩි ය.
$B$ සහ $C$ වල දිග සමාන නමුත් $B$ට වඩා $C$හි හරස්කඩ වර්ගඵලය වැඩි ය.





(අ) විද්‍යුත් ප්‍රතිරෝධයේ ආරෝහණ පිළිවෙළට $A, B$ සහ $C$ නම් කරන්න. (ලකුණු 03 යි)

(ආ) පහත පරිපථයේ බල්බයෙහි දීප්තිය උපරිම වන්නේ $P$ සහ $Q$ ලක්ෂ්‍ය අතර ඉහත $A, B$ සහ $C$ අතරින් කුමන කම්බිය සම්බන්ධ කළ විට ද? (ලකුණු 02 යි)




(ii) පහත ඉලෙක්ට්‍රොනික පරිපථය සලකා බලන්න.




(අ) මෙහි $P$ සහ $Q$ ලෙස දක්වා ඇති උපාංගය කුමක් ද? (ලකුණු 02 යි)


(ආ) මෙහි ඇති ස්විච්චියේ $A, C$ සංවෘත කළ විට දැකිය හැකි නිරීක්ෂණය කුමක් ද? (ලකුණු 02 යි)

(ඉ) පසු ව මෙහි ඇති ස්විච්චයේ $A, B$ සංවෘත කළ විට දැකිය හැකි නිරීක්ෂණය කුමක් ද? (ලකුණු 02 යි)

(ඊ) ඉහත (ආ) සහ (ඉ) අවස්ථාවලදී ධාරිත්‍රකයේ සිදු වූ සංසිද්ධි වෙන වෙන ම සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) ප්‍රධාන ට්‍රාන්සිස්ටර් වර්ග දෙක මොනවා ද? (ලකුණු 02 යි)

(ආ) රූපයේ දක්වා ඇති ට්‍රාන්සිස්ටරයේ $X, Y$ සහ $Z$ ලෙස සලකුණු කර ඇති අග්‍රවල නම් ලියන්න. (ලකුණු 03 යි)




Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**3.** (i) (අ) අවතල දර්පණවලින් සෑදෙන ප්‍රතිබිම්බ සඳහා කිරණ රූපසටහන් ඇඳීමේදී භාවිත කරන කිරණ වර්ග දෙකක් සහ ඒවා පරාවර්තනයෙන් පසු ගමන් ගන්නා ආකාර සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) අවතල දර්පණයක නාභීය දුර 15 cmක් නම් එහි වක්‍රතා අරය කීය ද? *(ලකුණු 01 යි)*

(ඉ) නාභීය දුර 15 cmක් වන අවතල දර්පණයක ධ්‍රැවයේ සිට 20 cmක් දුරින් ප්‍රධාන අක්ෂය මත තැබූ වස්තුවක ප්‍රතිබිම්බය සෑදෙන ආකාරය දැක්වෙන දළ කිරණ රූපසටහන අඳින්න. *(ලකුණු 03 යි)*

(ඊ) ඉහත (ඉ)හිදී සෑදෙන ප්‍රතිබිම්බයේ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*


(උ) එදිනෙදා ජීවිතයේදී අවතල දර්පණ භාවිතයට ගැනෙන අවස්ථා තුනක් ලියන්න. *(ලකුණු 03 යි)*

(ii) පහත රූපසටහනේ දැක්වෙන *A* සහ *B* යනු පාරදෘශ්‍ය මාධ්‍ය දෙකකි. *A* තුළින් ආලෝකය ගමන් කරන වේගයට වඩා *B* තුළින් ආලෝකය ගමන් කරන වේගය අඩු ය.

(අ) *A* සහ *B* අතරින් ඝනතර මාධ්‍යය කුමක් ද? *(ලකුණු 02 යි)*

(ආ) දී ඇති රූපසටහන ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන වර්තනයෙන් පසු ආලෝක කිරණය ගමන් ගන්නා මාර්ගය අඳින්න.

( *i* කෝණය *B* මාධ්‍යයේ අවධි කෝණයට වඩා අඩු ය.) *(ලකුණු 02 යි)*




(iii) (අ) සුදු ආලෝකය වීදුරු ප්‍රිස්මයක මුහුණතකට ආනත ව පතිත වූ විට එය විවිධ වර්ණවලට වෙන් වේ. මෙම සංසිද්ධිය කුමන නමකින් හැඳින්වේ ද? *(ලකුණු 02 යි)*

(ආ) ඉහත (අ) හි ඔබ සඳහන් කළ සංසිද්ධිය සිදු වන්නේ වීදුරු තුළදී ඒ ඒ වර්ණයට අදාළ ආලෝක කිරණවල කුමන ගුණයක් වෙනස් වන නිසා ද? *(ලකුණු 02 යි)*

**4.** (i) ප්‍රතික්‍රියා ශීඝ්‍රතාව කෙරෙහි බලපාන සාධක අධ්‍යයනය සඳහා සකස් කරන ලද ඇටවුම් තුනක රූපසටහන් පහත දැක්වේ. මෙම ඇටවුම් තුනෙහි ඇති පරීක්ෂා නළවලට එක ම සාන්ද්‍රණයෙන් යුත් හයිඩ්‍රොක්ලෝරික් අම්ලය සමාන පරිමා බැගින් එකතු කර ඇත.




(අ) පහත දැක්වෙන එක් එක් ඇටවුම් මගින් අධ්‍යයනය කරන ලද්දේ ප්‍රතික්‍රියා ශීඝ්‍රතාව කෙරෙහි බලපාන කුමන සාධකය ද?

(I) *X* හා *Y* *(ලකුණු 01 යි)*

(II) *Y* හා *Z* *(ලකුණු 01 යි)*

(ආ) (I) මෙම ඇටවුම්වල සිදු වන ප්‍රතික්‍රියාවල ශීඝ්‍රතා සංසන්දනය සඳහා භාවිත කළ හැකි නිරීක්ෂණයක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(II) ඔබ ඉහත සඳහන් කළ නිරීක්ෂණය වැඩි ම ශීඝ්‍රතාවකින් සිදු වන්නේ *X*, *Y* හා *Z* ඇටවුම් අතරින් කුමන ඇටවුමෙහි ද? *(ලකුණු 02 යි)*

(ඉ) මෙම පරීක්ෂාව සඳහා මැග්නීසියම් (Mg) වෙනුවට යොදාගත හැකි වෙනත් ලෝහයක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ඊ) ඉහත *X*, *Y* හා *Z* ඇටවුම් ඇසුරින් පරීක්ෂා කළ සාධක දෙකට අමතර ව ප්‍රතික්‍රියා ශීඝ්‍රතාව කෙරෙහි බලපාන වෙනත් සාධකයක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

[ 10 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

(ii) පහත අනුපිළිවෙළින් දැක්වෙනුයේ ආවර්තිතා වගුවේ දෙවන ආවර්තයට අයත් මූලද්‍රව්‍යයන් ය. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

Li  Be  B  C  N  O  F  Ne

(අ) ආවර්තිතා වගුවේ දෙවන කාණ්ඩයට අයත් මූලද්‍රව්‍යය කුමක් ද? *(ලකුණු 01 යි)*

(ආ) විද්‍යුත්-සෘණතාව වැඩි ම මූලද්‍රව්‍යය කුමක් ද? *(ලකුණු 02 යි)*

(ඉ) ද්විපරමාණුක අණු ලෙස පවතින මූලද්‍රව්‍ය දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ඊ) ස්ථායි ඉලෙක්ට්‍රෝන වින්‍යාසයක් ඇති මූලද්‍රව්‍යය කුමක් ද? *(ලකුණු 01 යි)*

(උ) මෙම ආවර්තයේ වමේ සිට දකුණට යන විට මූලද්‍රව්‍යවල ලෝහමය ගුණය කෙසේ වෙනස් වේ ද? *(ලකුණු 02 යි)*

(ඌ) Li සහ O සංයෝජනයෙන් සෑදෙන රසායනික සංයෝගයේ සූත්‍රය ලියන්න. *(ලකුණු 02 යි)*

**5.** (i) ශ්‍රී ලංකාවේ සිදුකරනු ලබන රසායනික කර්මාන්තයක් ලෙස ලුණු නිෂ්පාදනය හැඳින්විය හැකි ය.

(අ) ලුණුවල අඩංගු රසායනික සංයෝගය නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) ලුණු ලේවායක් සඳහා ස්ථානයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු පාරිසරික සාධක දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*


(ඉ) ලුණු ලේවායක සිදු වන ප්‍රධාන ක්‍රියාවලි දෙකෙන් එකක් වනුයේ මුහුදු ජලය වාෂ්පීභවනයට ලක්කිරීමයි. අනෙක් ප්‍රධාන ක්‍රියාවලිය කුමක් ද? *(ලකුණු 02 යි)*

(ඊ) ශ්‍රී ලංකාවේ ලුණු ලේවායන් පිහිටි ස්ථාන දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(උ) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කෙරෙන ලුණු 1 kgකට පොටෑසියම් අයඩේට් 40 - 50 mgක ප්‍රමාණයක් මිශ්‍ර කෙරේ. මෙම මිශ්‍ර කිරීමෙහි අරමුණ කුමක් ද? *(ලකුණු 01 යි)*

(ඌ) ආහාර රසකාරකයක් ලෙස භාවිතයට අමතර ව ලුණුවල වෙනත් ප්‍රයෝජනයක් සඳහන් කරන්න. *(ලකුණු 01 යි)*

(ii) පහත ගැලීම් සටහනෙහි සමචතුරස්‍රවල සංයෝගත් සෘජුකෝණාස්‍රවල ක්‍රියාවලිත් ඇතුළත් වේ. එය අධ්‍යයනය කර පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.




(අ) A හා B ස්ථාන සඳහා අදාළවන සංයෝග දෙක සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) X ස්ථානයට අදාළ වන ක්‍රියාවලිය නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ඉ) දිය ගැසූ හුනුවල ප්‍රයෝජනයක් සඳහන් කරන්න. *(ලකුණු 01 යි)*

(ඊ) හුනුගල්වල අඩංගු රසායනික සංයෝගය කුමක් ද? *(ලකුණු 02 යි)*

(උ) හුනුගල් රත්කිරීමේදී පරිසරයට එකතු වන වායුව නම් කරන්න. *(ලකුණු 01 යි)*

(ඌ) හුනුගල්, මැටි හා ජිප්සම් අමුද්‍රව්‍ය ලෙස භාවිත කර සිදු කරන රසායනික කර්මාන්තය නම් කරන්න. *(ලකුණු 02 යි)*

[ 11 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**6.** (i) හීමොෆිලියාව යනු ලිංග ප්‍රතිබද්ධ නිලීන ජානයක් (h) නිසා හටගන්නා ආවේණික රෝගී තත්ත්වයකි. මෙම ජානය පිහිටන්නේ X වර්ණදේහය මත පමණි.

(අ) හීමොෆිලියාවට අදාළ ව වාහක මවකගේ සහ නිරෝගී පියකුගේ වර්ණදේහ යුගල් ඇඳ දක්වන්න. *(ලකුණු 02 යි)*

(ආ) වාහක මවගේ සහ නිරෝගී පියාගේ ජන්මාණු සෑදීමේදී අදාළ වර්ණදේහ යුගල් වෙන් වන ආකාරය සහ ජන්මාණු සංසේචනයේදී ඒවා නැවත සංයෝජනය වන ආකාරය සටහනකින් ඇඳ දක්වන්න. *(ලකුණු 06 යි)*

(ඉ) වාහක කාන්තාවක් සහ නිරෝගී පුරුෂයකු අතර විවාහයකින් රෝගී පිරිමි දරුවකු බිහි වීමට ඇති හැකියාව (සම්භාවිතාව) ප්‍රතිශතයක් ලෙස සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ඊ) ආවේණික ලක්ෂණ ප්‍රවේණිගත වීම බුදු දහමෙහි එන කුමන නියාමය හා සම්බන්ධ ද? *(ලකුණු 02 යි)*


(උ) ප්‍රවේණි විද්‍යා දැනුම කෘත්‍රිම අභිජනනයේදී යොදා ගැනේ. කෘත්‍රිම අභිජනනයේ වාසි දෙකක් සහ අවාසි දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) ජෛව පරිණාමය සිදු වූ ආකාරය පහදා දෙන එක් වාදයක් වන්නේ ස්වාභාවික වරණ වාදය යි.

(අ) මෙම වාදය ගොඩනැගීම සඳහා චාල්ස් ඩාවින් පදනම් කරගත් මූලික නිරීක්ෂණ දෙක සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) එම නිරීක්ෂණ ඇසුරෙන් ඔහු ගොඩනැගූ උපකල්පන දෙක මොනවා ද? *(ලකුණු 02 යි)*

**7.** (i) මිනිස් මූත්‍ර වාහිනී පද්ධතියේ දළ රූපසටහනක් පහත දැක්වේ.




(අ) රූපයේ *A, B, C* සහ *D* ලෙස දක්වා ඇති කොටස් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ආ) මූත්‍රවල අඩංගු නයිට්‍රජනීය බහිස්ස්‍රාවීය ඵල දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ඉ) රූපයේ *A* ලෙස දක්වා ඇති අවයවය සෑදී ඇති ව්‍යුහමය සහ කෘත්‍යමය ඒකක කුමන නමකින් හැඳින්වේ ද? *(ලකුණු 02 යි)*

(ඊ) මූත්‍ර ගල්වල ප්‍රධාන වශයෙන් අඩංගු සංයෝගයක් නම් කරන්න. *(ලකුණු 01 යි)*

(උ) මූත්‍ර ගල් ඇති වීම වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) (අ) අප ගන්නා ආහාරයට පිත එකතු වන්නේ ජීරණ පද්ධතියේ කුමන කොටස තුළ දී ද? *(ලකුණු 02 යි)*

(ආ) ආහාර ජීරණයේ දී පිතෙන් ඉටු වන මෙහෙය කුමක් ද? *(ලකුණු 02 යි)*

(ඉ) ගැස්ට්‍රයිටිස් රෝග තත්ත්වයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ඊ) ගැස්ට්‍රයිටිස් ඇති වීම වළක්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් ලියන්න. *(ලකුණු 03 යි)*

* * *

Department of Examinations Sri Lanka